# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2497/37 - 2026 ජූලි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2026.07.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 5/2021

**2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත**

2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 17 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 48 වන වගන්තිය යටතේ බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලද සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝග.

**අනුර කරුණාතිලක,**
බලශක්ති අමාත්‍ය.

2026 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2026 අංක 01 දරන ඛනිජතෙල් සම්පත් ගිවිසුම නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. හඳුනාගත් බිම්කොටස් එකක් හෝ වැඩි ගණනක් තුළ ඛනිජතෙල් සම්පත් ගවේෂණය කිරීමට හෝ සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන තැනැත්තකු (මෙම නියෝගවල මින් මතු "ලංසු" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයෝජන යෝජනාවක්, අදාළ ලංසු කැඳවීමේ නිශ්චිතව දක්වා ඇති පරිපාලන ගාස්තු ගෙවීමක් සමග ඉදිරිපත් කළ යුතු ය.

3. 2 වන නියෝගයේ සඳහන් කරන ලද ලංසුවලට, ලංසු කැඳවීමේ ලේඛනවල නිශ්චිතව දක්වා ඇති පරිදි වූ සමාන ආකෘතියෙන් නිරවද්‍ය තොරතුරු ඇතුළත් විය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. 2 වන නියෝගය යටතේ ඉදිරිපත් කරන ලද ලංසු, අනුරූප ලංසු කැඳවීමේ නිශ්චිතව දක්වා ඇති නිර්ණායකවලට අනුකූලව රේඛීය අමාත්‍යාංශය මගින් කරන ලද ඉල්ලීමක් මත මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් පත් කරන ලද ව්‍යාපෘති කමිටුව විසින් අගයනු ලැබිය යුතු ය.

5. ව්‍යාපෘති කමිටුව විසින්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රමන්ත්‍රන කමිටුවට සහ (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය වෙත සිය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. ප්‍රමන්ත්‍රන කමිටුව සහ අධිකාරිය විසින් ව්‍යාපෘති කමිටුවේ සහය ඇතිව අවශ්‍ය අවස්ථාවල දී, අදාළ ආදර්ශ ඛනිජතෙල් සම්පත් ගිවිසුම මත පදනම්ව එක් එක් ඛනිජතෙල් සම්පත් ගිවිසුමට ඇතුළත් කළ යුතු නියම සහ කොන්දේසි කොන්ත්‍රාත්කරුවන් සමග සාකච්ඡා කරනු ලැබිය යුතු ය.

7. ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරය විසින්, අවසන් ඛනිජතෙල් සම්පත් ගිවිසුම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් එය අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

EOG 07 - 0192

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.